# ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය.
# ''CNCI විශිෂ්ඨතම කර්මාන්තකරුවා සම්මානය - 2024''
# අයදුම්පත්‍රය සඳහා උපදෙස් මාලාව් 2024

## 1. සුදුසුකම්

2023 මාර්තු 31 වැනි දින හෝ 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය වන විට අවම වශයෙන් වසර 3 ක් වත් (මහා පරිමාණ ව්‍යාපාර/ ඉතා විශාල පරිමාණ ව්‍යාපාර සඳහා වසර 4 ක් වත්) ශ්‍රී ලංකාව තුළ හෝ ඕනෑම රටක ව්‍යාපාරවල නියැලෙන ශ්‍රී ලාංකික ආයතන/ SAARC කලාපීය රටක පවත්වාගෙන යනු ලබන තනි පුද්ගල, හවුල් ව්‍යාපාර හෝ සීමාසහිත සමාගම් වලට අයත් නිෂ්පාදන හෝ සේවා කටයුතු වල නියැලෙන ආයතනවලට මෙම තරඟය සඳහා ඉල්ලුම් කළ හැක.

**ප්‍රාදේශීය සම්මාන**

ප්‍රාදේශීය සම්මාන සඳහා ඉල්ලුම්කරුවන් ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ හැර වෙනත් ඕනෑම පළාතක නිෂ්පාදන හෝ සේවා කටයුතු වල නියැලෙන ආයතන විය යුතුයි.

**ජාතික සම්මාන**

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක භාණ්ඩ හෝ සේවා නිෂ්පාදන හෝ සේවා කටයුතු වල නියැලෙන ආයතන වලට මෙම සම්මානය සඳහා අයදුම් කළ හැක.

**ඕනෑම රටක ව්‍යාපාරවල නියැලෙන ශ්‍රී ලාංකික ආයතන සඳහා වන සම්මාන**

ශ්‍රී ලංකාව හැර අනෙක් ඕනෑම රටක නිෂ්පාදන හෝ සේවා කටයුතු වල නියැලෙන ආයතනයක 50% වැඩි ශ්‍රී ලාංකීය කොටස් අයිතියක් ඇති (අයදුම් කරන මූල්‍ය වර්ෂය සඳහා) ඉතා විශාල, මහා පරිමාණ හෝ මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආයතන වලට පමණක් මෙම සම්මානය සඳහා අයදුම් කළ හැක. (විශේෂ අයදුම්පතක් ඇත)

**සාක් කලාපිය රටවල ආයතන සඳහා වන සම්මාන**

ඕනෑම SAARC කලාපීය රටක පිහිටා ඇති ඕනෑම නිශ්පාදන හෝ සේවා කර්මාන්ත (ඉතා විශාල, මහා පරිමාණ, මධ්‍යම පරිමාණ කර්මාන්ත) සම්මානය සඳහා සුදුසුකම් ලබයි. (විශේෂ අයදුම්පතක් ඇත)

## 2. ව්‍යාපාර වර්ගීකරණය හා ඇතුලත් වීමේ ගාස්තු

**නිෂ්පාදන අංශය**

මේ සඳහා සහභාගි වන නිෂ්පාදන ආයතන වසර 2022/2023 ශේෂ පත්‍රයේ අදාල වර්ෂ අවසානයේදී දක්වා ඇති එහි ''මුලු ආයෝජනය හෝ ශුද්ධ වාර්ෂික ආදායම යන අගයන් දෙකෙන් වඩා වැඩි අගය මත වර්ගීකරණය කරනු ලැබේ.
කරුණාකර ප්‍රශ්න අංක 1.1 සහ 1.2 පරිශීලනය කරන්න.

**සේවා අංශය**

තරගයට සහභාගි වන සේවා කර්මාන්තයන් වර්ගීකරණය කරනු ලබන්නේ ඔවුන්ගේ මූල්‍ය වර්ෂය අවසාන දිනයේ දැක්වෙන ශුද්ධ වාර්ෂික පිරිවැටුම මතය.

**ව්‍යාපාර වර්ගීකරණය හා ඇතුලත්වීමේ ගාස්තු පහත සඳහන් පරිදි වේ.**

| ව්‍යාපාර වර්ගය | නිෂ්පාදන අංශය (මුළු ආයෝජනය/ වාර්ෂික පිරිවැටුම) රු. මිලියන | සේවා අංශය පිරිවැටුම රු. මිලියන | අයකිරීම රු. | |
|---|---|---|---|---|
| | | | CNCI සාමාජික | CNCI සාමාජික නොවන |
| ක්ෂුද්‍ර පරිමාණ | රු.මි. 15 දක්වා | රු.මි. 20 දක්වා | 3,000.00 | 3,500.00 |
| සුළු පරිමාණ | >රු.මි.15 සිට රු.මි. 250 දක්වා | >රු.මි.20 සිට රු.මි. 250 දක්වා | 7,000.00 | 8,000.00 |
| මධ්‍යම පරිමාණ | >රු.මි.250 සිට රු.මි. 750 දක්වා | >රු.මි.250 සිට රු.මි. 750 දක්වා | 11,500.00 | 13,500.00 |
| මහා පරිමාණ | >රු.මි.750 සිට රු.මි. 1500 දක්වා | >රු.මි.750 සිට රු.මි. 1500 දක්වා | 20,000.00 | 24,000.00 |
| ඉතා විශාල | >රු.මි. 1500 ට වැඩි | >රු.මි. 1500 ට වැඩි | 25,500.00 | 27,500.00 |

## 3. SECTOR REPRESENTATION

Your company may be representing one of the following industries or may be in the “other” category. Please select and mention/specify your industry classification properly.

| Sector | Industry |
|---|---|
| **Manufacturing** | Printing and Packaging |
| | Coir&Coir based products |
| | Food and Beverage |
| | Agriculture and Farming |
| | Gem and Jewelry industry |
| | Chemicals and Paints |
| | Rubber& Plastic |
| | Wood & Wood Based |
| | Boat Building |
| | Automotive Component Manufacturing & Assembling |
| | Ceramic, Tile, Porcelain & Granite |
| | Electrical & Electronic |
| | Mineral & Mineral Based product |
| | Footwear & Leather Products |
| | Cosmetics and Pharmaceutical |
| | Metal, Die & Mold and Machinery |
| | Textile and Apparel Industry |
| | **Other (Please specify)** |

| Sector | Industry |
|---|---|
| **Service** | Construction |
| | Engineering |
| | Education |
| | Health Care and Wellness |
| | Tourism & Hotels |
| | Banks and Finance |
| | Audits and Consultancy |
| | Information Technology |
| | Repairs, Maintenance and Janitorial |
| | Trading |
| | Transport |
| | Defense and Security |
| | Electrical, Electronic and Plumbing |
| | **Other (Please specify)** |

## 4. <u>සම්මාන වර්ග</u>

**ප්‍රාදේශීය සම්මාන**

බස්නාහිර පළාත හැර අනෙකුත් සියළුම පළාත් ආවරණය වන පරිදි නිෂ්පාදන හා සේවා ව්‍යාපාර සඳහා ස්වර්ණ, රිදී හා ලෝකඩ සම්මාන සහ කුසලතා සම්මාන පිරිනැමේ. ජාතික වශයෙන් කුසලතා සම්මාන දිනා ගනු ලැබූ ජයග්‍රාහකයින් සඳහා එහි ඇති විශිෂ්ටත්වය හේතුවෙන්, ප්‍රාදේශීය මට්ටමේ කුසලතා සම්මාන සඳහා සලකා බැලීමක් සිදු නොකෙරේ.

**ජාතික සම්මාන**

නිෂ්පාදන /සේවා අංශ ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැලී සිටින ඉතා විශාල, මහා, මධ්‍යම, කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර සඳහා ස්වර්ණ, රිදී හා ලෝකඩ සම්මාන සහ කුසලතා සම්මාන ජාතික මට්ටමින් පිරිනැමේ.

**සාක් කලාපීය රටවල ව්‍යාපාර වල නියැලෙන ශ්‍රී ලාංකික ආයතන සඳහා වන සම්මානය**

ශ්‍රී ලංකාවේ නොවන අනෙකුත් සාක් රටවල පිහිටා ඇති අයිතිය හා පරිපාලනය ශ්‍රී ලාංකිකයන් සතුව පවතින ඉතා විශාල , මහා පරිමාණ හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා සම්මාන පිරිනැමේ.

**විශේෂ සම්මාන**

විශේෂ සම්මාන පිරිනැමීමේදී, ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් විශේෂිත වශයෙන් හඳුනා ගනු ලබන උතුරු සහ නැගෙනහිර පළාත් වල නිෂ්පාදන කර්මාන්ත සහ සේවා අංශය සහ විශේෂිත හැකියාවන් සහිත ව්‍යවසායකයින් සලකා බලනු ලබයි.

**පළිගු සම්මාන**

එකම අංශයක් යටතේ පිට පිට තෙවරක් ස්වර්ණ සම්මානය දිනාගන්නා නිෂ්පාදන හෝ සේවා කර්මාන්තයෙහි නියැලී සිටින ජාතික මට්ටමේ මධ්‍යම පරිමාණ, මහා පරිමාණ , ඉතා විශාල ව්‍යාපාර ආයතනයකට තෙවන වසරේදී පළිගු සම්මානය හිමිවේ. එවැනි ජයග්‍රහණ ලද සමාගම්/ආයතන වසර තුනක් ගතවන තුරු මෙම තරගාවලියට සහභාගි විය නොහැක.

## 5. <u>අයදුම්පත පිරවීම සඳහා උපදෙස්</u>

- ❖ අයදුම්පතෙහි අසා ඇති ප්‍රශ්න සඳහා තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කළ යුතු අතර එහිදී අදාල පරිදි ප්‍රශ්න අංක හා පිටු අංක අනුපිලිවෙලට සටහන් කළ යුතුය.
- ❖ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල ගිනුම් වාර්තා ලියාපදිංචි විගණකාධිවරයෙකු හෝ වරලත් ගණකාධිකාරී ආයතනයක් මඟින් සහතික කළ යුතුය. ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර විගණන වාර්තා ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ. නමුත් විශේෂ සුදුසුකමක් වේ. අනෙකුත් ව්‍යාපාර (ඉතා විශාල, මහා පරිමාණ සාක් කලාපීය අයදුම්පත ඇතුළුව) ඔවුන්ගේ විගණනය කරන ලද ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- ❖ පහත සඳහන් ලේඛණ වල ඡායා පිටපත් අයදුම්පත සමඟ අප වෙත යොමු කරන්න.
  - ➢ විශාල සහ මහා පරිමාණ අයදුම්කරුවන් විසින් පසුගිය මූල්‍ය වසර හතරක් සඳහා විගණනය කළ ගිණුම් වාර්තා (2019/20, 2020/2021, 2021/2022 සහ 2022/2023 විගණකගේ වාර්තාව සමඟ) හා කුඩා හා මධ්‍යම පරිමාණ කාණ්ඩයට අයත් අයදුම්කරුවන් පසුගිය මූල්‍ය වසර තුනක් සඳහා විගණනය කළ ගිණුම් වාර්තා 2020/2021, 2021/2022 සහ 2022/2023 විගණකගේ වාර්තාව සමඟ ඉදිරිපත් කරන්න.

- ගිණුම් වාර්තා, විගණන වාර්තා සහ විගණන වාර්තා පහත සඳහන් කාල සීමාවන් සඳහා අදාළ වේ.

| ගිණුම් කාල පරිච්ඡේදය | අවශ්‍ය විගණන ගිණුම් කාල පරිච්ඡේද |
|---|---|
| ජනවාරි 1 - දෙසැ. 31 | දෙසැ. 2019/2020/2021/2022 |
| අප්‍රේල් 1 - මාර්තු 31 | මාර්තු 2020/2021/2022/2023 |

- ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර සඳහා.

  අ). බැංකු ගිණුම් වාර්තා (වර්ෂ 2021, 2022, 2023)

  ආ). අදාල බැංකුවෙන් සහතික කරන ලද ණය පහසුකම් වාර්තා (අදාල කාලය සඳහා)

- 2021/22 සහ 2022/23 වසර වල (ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස) සඳහා සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දායකය සඳහා රිටන්ස් සහ ගෙවීම් වවුචර් වල පිටපත්.
- 2022/23 වසර සඳහා ආදායම් බදු වාර්තා වල පිටපත්
- සලකා බලන කාලය සඳහා තත්ත්ව සහතික, 5S වාර්තා සහ අනෙකුත් අදාල ලේඛණ වල පිටපත්.
- ශ්‍රී ලංකා කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික කර්මාන්තශාලා පරීක්ෂාවට අදාලව 2023 වසර සඳහා නිකුත් කරන ලද වාර්තාවේ පිටපතක්.
- මෙම වසර සඳහා ලබාගත් පාරිසරික සුරකුම් සහතිකයේ පිටපත්.
- ඔබ ව්‍යාපාරය විසින් දිනාගනු ලැබූ සම්මාන සහතික වල පිටපත් (මේ සඳහා 2019 සිට පසුගිය වසර 05 සඳහා පමණක් සලකා බලනු ලැබේ).
- අනෙකුත් අදාල සහතික සහ උපකාරක ලිපිලේඛණ වල පිටපත්.
- අයදුම්කරුගේ ප්‍රකාශය (සහාය ආකෘතියක් අයදුම්පත සමඟ අමුණා ඇත.)
-

## 6. <u>අයදුම්පත් පිරවීම සඳහා නිර්වචන</u>

### 1 කර්මාන්තයේ විස්තර

**1.1 මුළු ආයෝජනය (කොටස ඈ- 1.1)**

මුළු කොටස් ප්‍රාග්ධනය + සියලු සංචිත සහ රඳවා ගන්නා ලද ශුද්ධ ලාභය + දීර්ඝ කාලීන ණය (-) කර්මාන්ත කටයුතු සඳහා සෘජුව භාවිතා නොකරන ඉඩම් සහ ගොඩනැගිලි වල පොත් වල අගය

හෝ

මුළු වත්කම් (-) ජංගම වත්කම් + සියලු කර්මාන්ත කටයුතු සඳහා සෘජුව භාවිතා නොකරන ඉඩම් සහ ගොඩනැගිලි වල පොත් වල අගය

**1.2 ශුද්ධ පිරිවැටුම (කොටස ඈ - 1.2)**

දළ විකුණුම් - විකුණුම් ප්‍රතිලාභ, VAT සහ අනෙකුත් විකුණුම් බදු

**3 එකතු කළ අගය (Value Addition)**

**3. අ. මුළු සේවක වියදම්**

මෙයට වැටුප්, සහ වැටුප් අතිකාල, ප්‍රසාද දීමනා, EPF, ETF,

**3. ආ. කොටස් කරුවන්ට ලාභාංශ**

සාමාන්‍ය කොටස් කරුවන්, වරණීය කොටස් කරුවන්, ඡන්දහිමි හා ඡන්ද අහිමි කොටස් කරුවන් සඳහා  ගෙවන ලද ලාභාංශ.

**3.ඇ. ව්‍යාපාරයේ රැඳෙන මුදල**

I  ක්ෂයවීමක් ලෙස - මූල්‍ය වර්ෂය තුළ මුළු ක්ෂයවීම් වල අගය

ii.  ශුද්ධ ලාභය - වර්ෂයේ බදු මුදල් ගෙවූ පසු ශුද්ධ ලාභය.

සංචිතයක් ලෙස - මූල්‍ය වර්ෂය තුළ ලැබූ ලාභයෙන් මූල්‍ය සන්චිතයට යෙදවූ මුදල

**3. ඈ. ණය සඳහා ගෙවූ මුදල**

සියළුම කෙටි කාලීන සහ දිගුකාලීන ණය සඳහා ගෙවූ පොළිය.

**3. ඉ. රජයට බදු ගෙවීම්**

අදායම් බදු **+** වැට් **+** ජා.ගො.බ. **+** රඳවා ගැනීමේ බදු **+** ආර්ථික සේවා බදු **+** වරිපනම් බදු

**7 ව්‍යවස්ථාපිත සහ අනෙකුත් වගකීම් (කොටස ඇ - 7.1. අ, ආ, ඇ, ඈ, ඉ,)**

එක් එක් කාණ්ඩයට අදාල වන සහ සලකා බලන කාලසීමාව සඳහා වාර්ෂික සංෂිප්ත වාර්තා සහ තරඟ කරනු ලබන වසරේ අවසාන කාර්තුව සඳහා වන වාර්ෂික වාර්තා සහ ගෙවීම් වවුචර් වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**8 අනාගත සැලසුම්**

**8.2. අ,  ආයතනයේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය**

ආයතනයේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය, තහවුරු කළ හැකි සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය (වෙබ් අඩවිය තුළ, දැන්වීම් පත්‍රිකා තුළ, වාර්ෂික වාර්තාව තුළ සහ වෙනත්...)

**8.2. ආ, ආයතනික සැලසුම**

ඉදිරි වසර තුන සඳහා පූරෝකථනය කරන ලද අගයන් ඉදිරිපත් කළ යුතුය. පිළිතුර 'ඔව්' නම් තහවුරු කළ හැකි සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය.

**10. ගුණාත්මක සහ තත්ත්ව පාලන සහතිකය**

එක් එක් කාණ්ඩය සඳහා අනුකූල වන තහවුරු කළ හැකි සාධක සහ සාක්ෂි අමුණන්න.

**10.1 ගෘහස්ථ පාලන ක්‍රම**

භාවිතා කරන ක්‍රමවේදය හඳුන්වා දිය යුතු අතර, 2023 වසර අවසන් මාස තුන සඳහා අදාල ක්‍රියාකාරි කමිටු වාර්තා පිටපත් සහ තහවුරු කළ හැකි තත්කාලීන ඡායාරූප මේ සමඟ අමුණා එවිය යුතුය.

**13. කර්මාන්ත/වෘත්තිමය සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය**

පහත සඳහන් උපකරණ සහ ස්ථාපනයන් කර්මාන්ත සම්බන්ධ නීතිමය සංග්‍රහයන්ට/පාරිසරික පනත ප්‍රකාරව පවත්වාගෙන යා යුතුය.

- ✓ මෙහෙයුම් බොයිලේරු සහ වායු සම්පීඩක
- ✓ විද්‍යුත් ස්ථාපන
- ✓ ශබ්ද, අපද්‍රව්‍ය මෙහෙයුම්, බලශක්ති, ජලනල, හදිසි පිටවීම්, ගිනි අනතුරු, සංඥා, හදිසි රැස්වීමේ ස්ථාන, වෙනත්....)

## 7. <u>අයදුම් කිරීම</u>

- ❖ අයදුම්පත් ලබා ගැනීම - ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් සැකසුණු අයදුම්පත් පහත සඳහන් ස්ථාන වලින් ලබාගත හැක.
  - ✓ ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය, අංක 20 පළමු මහල, ගෝල්ෆේස් කෝට් 2, කොළඹ 03.
  - ✓ අදාල ප්‍රදේශීය/පළාත්/දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩල.
  - ✓ www.cnci.lk යන වෙබ් අඩවියෙන් හෝ 011 2452181 / 011 2339200 / 011 2331444 දුරකථන අංක වලට ඇමතීමෙන්.
- ❖ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වර්ෂ 2024 /03/29
- ❖ සම්පූර්ණ කරන ලද අයදුම්පත වෙනමත් අනෙකුත් සියළුම ලිපිලේඛණ වෙනමත් පොතක් ආකාරයෙන් සකස් කර භාරදිය යුතුය.

- ❖ අයදුම්පත් සහ ඊට අදාළ ලියාපදිංචි කිරීමේ ගාස්තු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර භාර දිය යුතුය. චෙක්පත් ''ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය'' යනුවෙන් ලියා ආදායකයාගේ ගිණුමට රේඛනය කළ යුතුය.

- ❖ **සම්මාන සඳහා අයදුම්පත්**

  සම්මාන සඳහා අයදුම්පත් අදාල ප්‍රාදේශීය වාණිජ හා කර්මාන්ත මණ්ඩල හරහා හෝ සෘජුවම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය වෙත ඉදිරිපත් කරන්න. අයදුම්පත් භාරදිය හැකි ප්‍රාදේශීය වාණිජ හා කර්මාන්ත මණ්ඩල පිටු අංක 8 හි දක්වා ඇත.

❖ **සාක් කලාපීය රටවල ව්‍යාපාර වල නියැලෙන ශ්‍රී ලාංකික ආයතන සඳහා වන සම්මානය**

මෙම සම්මානය වෙනුවෙන් අයදුම්පත සෘජුවම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය වෙත යොමු කරන්න.

## 8. ඇගයීම් හා ජයග්‍රාහකයින් තේරීම

### 8.1. ජාතික හා ප්‍රාදේශීය ව්‍යාපාර සඳහා වන සම්මාන

**අ.** සෘජුවම හෝ අදාල ප්‍රාදේශීය වාණිජ හා කර්මාන්ත මණ්ඩල හරහා අප වෙත ලැබෙන සියළුම අයදුම්පත් ඇගයීමට ලක් කෙරෙන අතර විනිශ්චය මණ්ඩලයේ නිර්නායකයන්ට හා අදාල නීති නීතිප්‍රකාරව ජයග්‍රාහකයන් තෝරා ගනු ලැබේ.

**ආ.** ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ කර්මාන්තකරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.

**ඇ.** අවසාන වටයට තෝරා ගන්නා ව්‍යාපාර විශේෂ අධීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යාපාර ස්ථාන වෙත පැමිණ අධීක්ෂණය කිරීමට ඉඩ ඇත.

**ඈ.** විනිශ්චය මණ්ඩලයේ තීරණය මත සතුටුදායක මට්ටමේ අයදුම්පත් ලැබී නොමැතිනම් අදාල ව්‍යාපාර වර්ග සඳහා සම්මාන එකක් හෝ වැඩි ප්‍රමාණයක් ප්‍රදානය නොකෙරේ.

**ඉ.** ප්‍රාදේශීය සම්මාන සඳහා ඉල්ලුම්කර ඉතා ඉහල මට්ටමේ ප්‍රගතියක් පෙන්නුම් කරනු ලබන ව්‍යාපාර විනිශ්චය මණ්ඩලයේ තීරණය මත ජාතික සම්මාන සඳහාද සුදුසුකම් ලබයි.

**ඊ.** විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන අතර, එම තීරණය සම්බන්ධයෙන් කරනු ලබන විමසීම්, යෝජනා හෝ චෝදනා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය මඟින් භාරගනු නොලැබේ.

**උ.** බාහිර විනිශ්චය මණ්ඩලයේ හා කර්මාන්ත මණ්ඩලයේ විනිශ්චය මණ්ඩල සාමාජිකයින් සම්බන්ධ ආයතන වලට මෙම තරඟයට ඉල්ලුම් කළ නොහැක.

**ඌ.** මෙම ක්‍රියාවලියේ සෑම අවස්ථාවකදීම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය සියළු අයදුම් පත්වල රහසිගතභාවය ආරක්ෂා කරමින් විශ්වාසවන්තව කටයුතු කරන බවට සහතික කරන අතර, අයදුම්කරුවන් විසින් සපයනු ලබන සියලු විස්තර විනිශ්චය මණ්ඩලය පමණක් පරීක්ෂා කරන බව ද ප්‍රකාශ කරමු. තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ගේ විස්තර හා වෙනත් ලියකියවිලි සහමුලින් විනාශ කරනු ලබන්නේ බාහිර විනිශ්චය මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ප්‍රතිඵල පිළිබඳ අවසාන තීරණය ගත් පසුව නියමිත කාලයක් සුරක්ෂිතව තබා ගැනීමෙන් ද අනතුරුවයි.

**එ.** විනිශ්චය කමිටුව සහ විද්වත් මඩුල්ල වඩා හොඳ සම්ප්‍රදායන්ගෙන් යුතුව සහ ස්වාධීනව පිහිටුවා ඇති බව හඳුනා ගෙන ඇත.

**ඒ.** ශ්‍රී ලංකා රජය විසින් සෞඛ්‍ය අනතුරු ඇඟවීම් ඇතුළත් කළ යුතු බවට අවධාරණය කර ඇති නිෂ්පාදන ආයතන මෙම සම්මාන ප්‍රදානයන් සඳහා සලකා බලනු නොලැබේ.

**8.2 සාක් කලාපීය සම්මාන**

**අ.** සාක් කලාපීය රටවල අයදුම්පත් ඇගයීම් හා ජයග්‍රාහකයන් තේරීම ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් පත්කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් මගින් අනුමත ක්‍රමවේද හා උපදෙස් මත අදාල රටවල කර්මාන්ත හා වාණිජ මණ්ඩල මගින් සිදුකරනු ලැබේ.

## 9. ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කිරීම

වසර 2024 ජයග්‍රාහකයින් පිළිබඳ දැනුම්දීම සම්මාන ප්‍රදානෝත්සවයට අවම වශයෙන් සතියකට පෙර කෙරෙනු ඇත.

**සභාපති**
**සංවිධායක කමිටුව**

**ප්‍රාදේශීය වාණිජ හා කර්මාන්ත මණ්ඩල**

01. අම්පාර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

02. අනුරාධපුර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

03. මඩකලපු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

04. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

05. ඌව පළාත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

06. හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

07. මාතලේ දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

08. මාතර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

09. නුවරඑළිය දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.

10. රත්නපුර වාණිජ හා කර්මාන්ත මණ්ඩලය.